# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014
### 2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්
### මානවශාස්ත්‍ර පීඨය

### නාට්‍ය හා රංග කලාව

### රංග කලාවේ මූලිකාංග DMAT – E 1015

**ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. නාට්‍ය හා රංග කලාව යන යෙදුම් දෙකෙහි වෙනස පැහැදිලි කොට, පෙරදිග හා අපරදිග පඬිවරුන් නාට්‍ය යනු කෙබඳු කලාවක් දැයි කර ඇති නිර්වචන විමසා බලන්න.

02. "රංග කලාවේ මූලිකාංග ඇරඹුණේ අභිචාර විධි හා යාතුකර්ම හේතුකොට ගෙනය." පැහැදිලි කරන්න.

03. "නාට්‍ය යනු ක්‍රියා අනුකරණයකි." "නාට්‍ය යනු අවස්ථා අනුකරණයකි." මෙම ප්‍රකාශ දෙක සමකාලීන රංග කලාව අර්ථ දැක්වීමට කොතෙක් දුරට ප්‍රමාණවත් දැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

04. සෙසු කලා මාධ්‍යයන් හා සසඳමින් වේදිකා නාට්‍ය කලාවේ සුවිශේෂතා විග්‍රහ කරන්න.

05. කතන්දරය (Story) හා කතා වින්‍යාසය (Plot) අතර ඇති සමාන අසමානතා නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

06. නාට්‍ය රචනය, රඟපෑම සහ අධ්‍යක්ෂණය යන කාර්යයන්හි දී නාට්‍ය නිර්මාණයට පැනවෙන සීමාවන් මොනවා දැයි විමසන්න.

07. "ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත." නිදර්ශන සහිතව විමසන්න.

08. ග්‍රීක හා සංස්කෘත නාට්‍යයේ ප්‍රභවයට බලපෑ ආගමික පසුබිම පැහැදිලි කරන්න.

09. මාතෘකා හතරකට (04) කෙටි සටහන් ලියන්න.
    - අ. සතර අභිනය
    - ආ. ඛේදාන්ත (Tragedy) සහ සුඛාන්ත (Comedy)
    - ඇ. නෘත්ත, නෘත්‍ය, නාට්‍ය
    - ඈ. ගායන වෘන්දය (Chorus)
    - ඉ. භාව විශෝධනය (Catharsis)
    - ඊ. අනුකරණය

**********************